# පංච කාව්‍ය (පංච ගාව්‍යා)

ඈත අතිතයේ පටන් ඉන්දියාවේ ගොවින් ගවයා මුලික කොට ගත් ගොවි තැනක නියැලි සිටි බව අදටත් පවතින විවිද චාරිත්‍ර තුලින් කිය හැකිය එබැවින් නුතන ලෝකයේ ආසියාව අප්‍රිකාව හා ලතින් ඇමරිකාවේ බොහෝ තැන් වල ගවයා මුලික කරගත් ගොවිතැන් ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව අප දන්නා පරිදි බොහෝ ගොවින් ගවයා වන්දනිය ලෙස පුදනු ලැබේ. අදටත් තයිපොන්ගල් දිනයේදී ගවයාට විවිධ සත්කාර කරනු ලැබේ.

ගවයාගෙන් ලබා ගන්නා පංචවිධ ද්‍රව්‍යයන් හෙවත් ගොම, මුත්‍ර, කිරි, මුදවපු කිරි සහ ගිතෙල් යන කොටස් 5 ගෙන ක්ෂුද්‍රජිවි ක්‍රියාවලියක් ඒ තුලට ගෙන එම සඳහා පලතුරු සහ කැලයකින් ලබා ගන්නා මතුපිට පස් කිලෝ 2 ප්‍රමාණයකින් මෙම ද්‍රවණයට මුල පුරන අතර ඒවා සමඟ රනිල ශාකයක කොළ සහ ක්ෂුද්‍ර ජිවින්ගේ ක්‍රියාකාරිත්වය වැඩි කර ගැනිම සදහා සක්කර හෙවත් උක් හකුරු හෝ උක් පැනි නිෂ්පාදනයේදි අතුරු ඵලයක් වන මොලැෂස් කිලෝ 2 සිට 5 දක්වා එක්කරගනු ලැබේ. එහිදි ක්ෂුද්‍ර ජිවි ගහනය වැඩි කර ගැනිම සදහා ඉදුනු පලතුරු සහ ගොම, සක්කර ගන්නේ නම් එවාද මුදවපු කිරි සහ කොලවර්ග එයට මිශ්‍ර කර පොලිසැක් මල්ලකට සමාන්‍ය ව්‍යාවහාරයේදි යොදා ගන්නා පොහොර මල්ලකට දමා එයට බරක් ලෙස කලු ගලක්ද ඇතුලට දමා කට හොදින් ගැට ගසුනු ලැබේ.

පසුව එය ජලය ලිටර් 170 එක් කරන ලද බැරලයක් තුල බස්සනු ගිල්ලනු ලැබේ. එම ජලයට ගවමුත්‍ර ලිටර් 5ත් 10ත් අතර ප්‍රමාණයක් කිරි ගිතෙල් ආදිය සියල්ල එකතු කරනු ලැබේ. සක්කර වෙනුවට අප යොදාගනු ලබන්නේ මොලැෂස් නම් මොලැෂස්ද එම ජලයට එක්කරනු ලැබේ. එලෙස සියල්ල එක් කරන ලද බැරලයේ කට ගොනියකින් හෝ වෙනත් පියනකින් වසා තැපිය යුතුය. විශේෂයෙන් එය කරනු ලබන්නේ සතුන් එම දියරයට ආකර්ෂනය වන බැවින් ඔවුන් වැටි එම දියරය අපවිත්‍ර වන නිසාය.

මෙලෙස එම දියරය දින පතා කැලතිය යුතු අතර මිශ්‍ර කිරිම මගින් එම මිශ්‍ර කිරිම දින 28 දක්වා සිදු කිරිමෙන් පසු ප්‍රයෝජනයට ගත හැකි වනු ඇත. යම් හෙයකින් එම බැරලය යට කොටසට කරාමයක් සකස් කිරිම තුලින් මෙම සාන්ද්‍රණය පිටතට ගැනිමට පහසුවක් ලබා දෙනු ඇත.

එලෙස සකස් කර ගත් දියරය එක කොටසක් ජලය ලිටර් 15ක් පමන එක්කාසු කොට එලවලු වලට යෙදිය හැක. එය මල් බාල්දියකින් හෝ එසේ නොමැති නම් හොදින් පෙරා ගෙන් දියර ඉසිනයකින් ඉසිය හැක. මෙයට එක් කර ගනු ලබන ද්‍රව්‍ය වල ප්‍රමාන හරි ආකාරව එක්කර ගත යුතු සේම ජලය කවලම් කිරිමේදිද ලබාදි ඇති උපදෙස් අනුව ක්‍රියා කර යුතුය. විවිධ බෝග වලට විවිධ අනුපාතයන් දක්වා ඇත. ඒ අනුව නිවැරදි ආකාරයට වගාවට යෙදිම තුලින් සාර්ථක ප්‍රතිපල බලා ගැනිමට හැකි වන ඇත.

**පංච කාව්‍යා සාදා ගැනිමේදී ඔබට අවශ්‍ය ද්‍රව්‍ය**

1. ලිටර් 225ක බැරලයක්

2. ගොම කිලෝ 10

3. ගව මුත්‍ර ලිටර් 10 අතර ප්‍රමාණයක්

4. ගිතෙල් බෝලත් බාගයක්

5. ස්වාභාවිකව මුදවන ලද කිරි ලිටර් 03

6. නැවුම් කිරි ලිටර් 03

7. ඉදුනු පළතුරු කිලෝ 05

8. කැලයකින් ලබා ගන්නා ලද මතුපිට පස් කිලෝ 02

9. රනිල කොල කිලෝ 05 (ග්නිසිරියා, ලාඩප්පා, වල්සුරියකාන්ත වැනි ශාකා වඩා සුදුසු වේ)

10. උක් හකුරු හෙවත් සක්කර හෝ මොලැෂස් කිලෝ 02ත් 05 අතර ප්‍රමාණයක්

11 රොක් පොස්පේට් කිලෝ 02

ලංකා කාබනික කෘෂිකර්ම ව්‍යාපාරය (LOAM) විසින් විද්‍යාත්මක පර්යේෂණ හා අත්දැකීම් පාදක කොට ගෙන මෙය සකස් කොට ඇත

L O A M

**Lanka Organic Agriculture Movement**

ලංකා කාබනික කෘෂිකාර්මික ව්‍යාපාරය

இலங்கை சேதன விவசாய இயக்கம்